


Grade 07- Lesson 13

Prepared By: W.D Priyantha Menaka


School: WP/ Minu/ Dudley Senanayake A.M.V


Mirigama.

# මාතෘකානුකූලව රචනා ලිවීම

**සැලකිලිමත් විය යුතු කරුණු :-**

- කරුණු මැනවින් සංවිධානය කර ගැනීම
- දළ සටහනක් (රචනා සැකිල්ලක්)සාදා ගැනීම
- සැකිල්ලට අනුව ඡේද වෙන් කරමින් තර්කානුකූලව අදහස් ඉදිරිපත් කිරීම
- සිත්ගන්නා ශෛලියකින් වාක්‍ය රචනය ලිවීම
- නිවැරදි වාක්‍ය රටා අනුගමනය කිරීම .(උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය )
- සුදුසු පරිදි විරාම ලකුණු යෙදීම
- පද නිසි ලෙස ඇත් කර ලිවීම හා පැහැදිලි අත්අකුරු ලිවීම


ආකෘතිය
1. ප්‍රවේශය හෙවත් ආරම්භය
2. මාතෘකානුකූල විෂය කරුණු
3. සමාලෝචනය හෙවත් අවසානය




ඔයාලගේ පොතේ තියෙන රචනාවට අනුව අපි බලමු මේ රචනාවෙ ඡේදයෙන් ඡේදය ට කොහොමද කරුණු ගොනු කරල තියෙන්නෙ කියලා .

මුලින්ම අපි දකිනවා "සුන්දර හෝටන්තැන්න " කියන මාතෘකාව.




දෙස් විදෙස් සංචාරකයන් නිබඳව ම තමා වෙත කැඳවන හෝටන්තැන්න මුහුදු මට්ටමේ ඉඳල මීටර් දෙසීයකට අධික උසකින් පිහිටි බව. රටේ උසම තැනිතලා භූමිය බව. සීතල මීදුම මොහොතින් මොහොත වෙනස් වෙන ආකාරය දේශගුණික පරිසරයෙන් හැඩ වුණ පරිසර සම්පත් බොහෝ දැකුම්කලු වෙනවා. එතකොට ඉමක් කොනක් නැතුව පේන තැනිතලාව ගත සිත පිනවන වටපිටාව, ලෝකාන්තය ,බේකර්ස් ඇල්ල ,හෝර්ටන් තැන්නේ පොහොසත් බවට සාධක වගේ කියලා කියනවා.










හෝටන්තැන්නේ තුරු ලතා නිර්මාණය වෙලා තියෙන ආකාරය,

සුළඟට සීතලට ඔරොත්තු දෙන ආකාරයට ඒ වගේම කුඩා පත්‍ර සන බූවක් තිබෙන බව ගසේ කඳ සන පොත්තකින් සැරසිලා තියෙන ආකාරය.


එතකොට චණ්ඩ මාරුතයට මුහුණ දෙන ආකාරය,

ඒ වගේම නෙතට රසදුනක් වෙමින් ඇතින් පේන තණ බිම.

ශ්‍රී ලංකාවට ආවේණික පැගිරි මාන තෘණ පඳුරු තුත්තිරි පවුලට නෑකම් කියන තණ පඳුරු තණපලසේ දකින්න තියෙනවා කියලා කියනවා.






තුන්වන ඡේදය :- ජල මූලාශ්‍රය හා ඒ ආශ්‍රිත ශාක









ඒ සුන්දර හෝර්ටන් තැන්නේ මනහර දසුන් කිහිපයක් තමයි මං ඔයාලට මේ දැම්මේ.

ඒ ඡේදය තුළ කියනවා බෝවිටියා මල් ගැන ,ඒ වගේම තවත් ඔය කූඩලු වර්ග ,බිගෝනියා වර්ග, කෙකටිය වර්ග ,දිය පාසි ,ඒ වගේ ම සීතල දිය රැඳුණු කුඩා දිය පහරවල් ඒ බසයන ජලාශවලින් අපේ දෙපා දෙයත් සෝද ගන්න පුලුවන් නම් කොච්චර සිසිලසද .


ඒවගේම මේ පරිසරයේ දකින්න පුළුවන් චමත්කාර දසුන් කිහිපයක් තමයි මං ඔයාලට මේ එකතු කරලා තියෙන්නේ.





මේ  ඒ සුන්දර දිය කඩිතිවල ඉන්න මාළු වර්ග.



හෝර්ටන් තැන්න පුරා තැනින් තැන මතුවන  සුදු පැහැති මීදුම් සළුව වේදිකාවක සුදු පැහැති කඩ තිරයක් වගේ නෙත් සිත් පැහැර ගන්නවා.

ඒ වගේම මීදුම් සළුව හැකිලිලා යනකොට ඒ දෙසින් පෙනෙන පරිසරය තවත් චමත්කාරජනක වෙනවා .

ඈතින් දිස්වන ගුවන් ගැබ සිඹින කඳු හිස් ,නිල් පැහැගත් විචිත්‍රවත් දසුන් මවනවා.


පස්වන ඡේදය:- හෝර්ටන් තැන්නට
ආවේනික පක්ෂීන් හා සිවුපා සතුන්







මේ රූප වල පෙනෙන්නේ දැකුම්කළු කුරුල්ලෝ ,

තුරු හිස් මත අපූර්ව සිවුරුහන් හඬ නගමින් ලංකාවට ආවේණික,

මල් අවිච්චියා , ගොමරිටා, හම්බු කුරුල්ලා මහ නීල ගොයා ,ලංකා මල් කුරුල්ලා ,නිල් ඇසිමාරාවා, වලිකුකුළා වැනි පක්ෂීණ් පරිසරය විසිතුරු කරනවා. අලංකාර වූ වානරයෝ තුරු හිස් මත ඉඳගෙන බුකු බුකු හඬ නගනවා .

ඉන් හෝර්ටන් තැන්නේ විසිතුරබව තවත් වර්ධනය කරනවා.










මේ තියෙන්නේ හෝටන්තැන්නේ සුවිශේෂී අංගයක් වන ලෝකාන්තයයි .


දවසේ පැය විසි හතරේ වැඩි කාලයක් මීදුමෙන් වැසී යන මේ ලෝකාන්තය,


සුදු මීදුම් පටල අනන්ත අවකාශයක් පුරා පැතිර ඇති ආකාරය හිතට දනවන්නේ ගැඹුරු අගාධය ,හිසමත සිට ලෝකාන්තය නැරඹිය යුත්තේ ඉතා පරිස්සමින් එබී බැලීමෙනි.

බොහෝ දෙනා තුළ ජීවිතයේ ගුප්ත බවත් ,ඒවගේම සෞන්දර්යයත් ඉස්මතු වෙනවා .නොඅනුමානයි .


ඒ අපූර්ව දර්ශනයකි.

ඉතා පැහැදිලි කාලගුණයක් ඇති දිනයකදි නම් මෙහි සිට නරඹන්නෙකුට ඈත බලංගොඩ ප්‍රදේශයේ සලකුණු ඉතා කුඩාවට දැකගන්න පුළුවන්.



මේ ඔබ දකින්නේ සුදෝ සුදු පෙණ කැටි දස දහස් ගණනාවක් මවාපාමින් ඇදහැලෙන ක්ෂීර ධාරාවක් වැනි බේකර්ස් ඇල්ලයි. හෝටන්තැන්නේ තවත් විචිත්‍රවත් ස්ථානයක් ලෙස සොබා සිරිය විඳ ගැනීමට රිසි බොහෝ රසවතුන් බේකර්ස් දිය ඇල්ල නැරඹීමට අමතක නොකරති . හෝටන්තැන්න ජාතික උද්‍යාන වර්ග කිලෝමීටර් 31.5 ක ප්‍රමාණයකින් යුක්ත වන බැවින් ඒ හැම සිරියක් ම නැරඹීමට දින කීපයක් ගත කරන්න සිද්ධ වෙනවා.






- අපමණ සුන්දරත්වයකින් හා පාරිසරික විවිධත්වයක් ඇති හෝටන්තැන්න දේශීය විදේශීය සංචාරකයන් කැඳවන පාරාදීසයකි .
- ඒ වගේම විවිධ ශාක, සත්තු ජල තටාක ,තෘණපඳුරු, මේවා දකින හැමෝගෙම සිතට සුවදායක බවක් ගෙන දෙනවා. මේ බිම් ආරක්ෂා කර ගැනීම අප සැමගේ යුතුකමක්.

- දැන් මේ කියෙව්වේ ඉතාමත් රටාවක ට අනුව ලියන ලද සාර්ථක රචනාවක්.

- මේ රචනාව තුළ තියනවා සැලසුමක් ,ඒ සැලසුම නිසා ක්‍රමවත් පිළිවෙලකට රචනාව ලියලා තියෙනව. රචනාවක් ලියනකොට කරුණු , පෙළගැස්වීම, අවසානය ඉතාම වැදගත් මේ රචනය මේ විදිහට අවබෝධ කරගත්තට පස්සේ ඔබට පුළුවන් ඔයාලගේ පෙළ පොතේ 110, සිට 113 පිටු වල තියෙන රචනා මාතෘකා හොඳින් කියවල රචනාවක් ලියන ආකාරය හොඳින් අවබෝධ කරගන්න.

- මම මේ රචනාව වඩාත්ම හොඳින් අධ්‍යයනය කිරීමට පහසුව පිණිස සකස් කළා. පොතේ තියෙන රචනය ආපසු කියවන්න.

මේ අනුව වාක්‍ය රචනය සඳහා සැකිලි පිළියෙල කර ගැනීමේ නිපුණතාව සංවර්ධනය කර ගැනීමට පහත ඉදිරිපත් කර ඇති රචනා සැකිලි කිහිපය ද අධ්‍යයනය කරන්න.

### වැසි දිනයක්

වර්ෂාවට පෙර පරිසරයේ ඇති වූ වෙනස
වැසි පොද වැටීම ආරම්භ වූ ආකාරය හා පරිසරයේ ඇති වූ තත්ත්වය
ක්‍රමෙන් මහා වර්ෂාවක් බවට පත් වූ ආකාරය
වර්ෂාව නිසා පරිසරයේ ඇති වූ වෙනස්කම්
අවසානය

## පොදු දේපල සුරකිමු

පොදු දේපළ යනු කුමක්ද?

පොදු දේපළ රැක ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට සිදු වූයේ ඇයි?

පාසල පොදු දේපළකි. එය රැක ගත යුතු ආකාරය

රෝහල රැකගත යුතු ආකාරය

ගමනාගමනය සලසන රථවාහන ආරක්ෂා කළ යුතු පිළිවෙළ

පොදු දේපළ රැක ගැනීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග

මහජනයාගේ යුතුකම

අවසානය

## වැඩිහිටියන් රැක බලා ගනිමු

වැඩිහිටියන් යනු කවුරුන් ද?

වැඩිහිටියන් රැක බලා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමට සිදු වීම

වැඩිහිටියන්ගේ අගය, ඔවුන් සමාජයට සම්පතක් වන බව

වැඩිහිටියන් රැක බලා ගැනීම උදෙසා නිවස තුළ සිදු කළ යුතු කාර්යයන්

රජය ගත යුතු ක්‍රියා මාර්ග

සමාලෝචනය

"එරබදු තුරු මලින් හැඩ වේ. කොහා එය අපූරු ගීතයකට නගයි. ජම්බු ගස රත් පැහැ ගනී. අඹ, පේර ගස්වලට එල නො ඉදවා ම බැරි ය. වෙනත් තැනක ඉදුණු රඹකැන් ය. ගෙමිදුල අමුතු වෙනසකි. නිවසේ බිත්ති නව පාට ගෙන තිබේ. බඩුමුට්ටු ද අලුත් වෙලා ය. කොලුකුරුට්ටෝ කිරි කවඩි අතට ගනිති. දුර බැහැර සිට දූ දරුවෝ බර පොදි රැගෙන ගමට පැමිණෙති. ලොකු සූදානමකි."

ඉහත නිදසුන මෙන් ඔබ ද වාක්‍ය රචනය නිර්මාණාත්මකව ලිවීමට හුරු වන්න. නිර්මාණාත්මක ලේඛනයේ දී හැකි තාක් කෙටි වැකි ඉදිරිපත් කිරීම සුදුසු ය. කෙටි වැකි ලිවීමට පෙලඹීමෙන් නිවැරදි ලිඛිත භාෂාවක් ඔබට ඉදිරිපත් කළ හැකි වෙයි. වාක්‍ය රචනයේ නිවැරදි භාෂාව පිළිබඳ පන්ති කාමරයේ දී කරුණු තවදුරටත් හදාරන්න. එසේ ම වාක්‍ය රචනය ඡේද වශයෙන් ද ඉදිරිපත් කළ යුතු වෙයි. ඡේද තුළ ඇතුළත් වාක්‍ය ලිවීමේ දී නිවැරදි විරාම ලකුණු යෙදිය යුතු ද වෙයි. වාක්‍ය රචනය සඳහා හැකි තරම් පැහැදිලි අත් අකුරු ඉදිරිපත් කිරීමට උත්සුක වන්න. ඒ සියල්ල මෙන් ම ප්‍රමාණවත් වචන සංඛ්‍යාවක් ලිවීමේ නිපුණතාව ද ළඟා කර ගැනීම වැදගත් වේ.

## ලිඛිත අභ්‍යාස

1. මේ කොටස අධ්‍යයනය කරන්න.

   "මාගේ නෙත් ඉබේ මිදුලට දිවී ය. ආලෝකයක් ගත් මිදුල මා එහි කැඳවී ය. දැන් මාගේ දෙපා මිදුල මැද ය. අපූරු පරිසරයකි. සඳ පායා රස් මිහිතලය මතට ගලයි. සියොත් කැල ගුවන් ගැබ ඔබ මොබ සරති. සුවඳ විහිදුවමින් අවටින් පිපී එන කුසුම් ය. ගත සිත නළවන සිසිල් සුළඟ ගලා ගෙන එයි."

   ඉහත ඡේදයට විශේෂණ පද හා අලංකාර යෙදුම් එක් කර නවත් නිර්මාණාත්මකව ලියන්න.

2. මේ ඡේදය කෙටි වැකිවලින් ඉදිරිපත් කරන්න.

   ගමේ ගෙවිලියන් සමූහ වශයෙන් කුඹුරු යායට ගොස් තම තමන්ගේ කුඹුරුවලට බැස කවි කියමින් වැඩී ගෙන එන ගොයමේ වල් පැළ ගලවමින් පාලු තැන්වල ගොයම් පැළ සිටුවීම මනහර දර්ශනයකි.

3. 'පියකරු උදය', 'සඳපහන් රැය', 'කඳුකර අසිරිය' මෙයින් ඔබ වඩාත් කැමති මාතෘකාව යටතේ කෙටි වැකි යොදමින් නිර්මාණාත්මක ඡේද කිහිපයක් ලියන්න.

4. පහත ඉදිරිපත් කර ඇති එක් එක් මාතෘකා සඳහා රචනා සැකිල්ල බැගින් ලියන්න.

   i. පුරාවස්තු රැක ගනිමු
   ii. සිය රට දේ සිරි සැප දේ
   iii. මම ගංවතුරකට මැදි වීමි
   iv. අධ්‍යාපනය සාර්ථක ජීවිතයකට මං සලසයි

5. පහත සඳහන් මාතෘකා අතුරින් ඔබ කැමති මාතෘකාවක් යටතේ රචනා සැකිල්ල පිළියෙල කර ඒ යටතේ වචන දෙසීයක පමණ වාක්‍ය රචනයක් ලියන්න.

   i. දෙමවුපියන්ගේ අගය
   ii. වන අසිරිය රැක ගනිමු
   iii. දහම් පාසල් අධ්‍යාපනයේ අගය
   iv. අපෙන් පාසලට ඉටු විය යුතු යුතුකම්
   v. ගැමි දිවියේ මිහිර

මේ පිටු හොඳින් කියවා, දී ඇති අභ්‍යාස කරන්න. ඒ තුළින් ඔබගේ දැනුම වැඩිකර ගැනීමටත් ,සාර්ථක රචනාවක් ලියා ගැනීමටත් , ඔබට නිබඳවම හැකිවනු ඇත !!!.

***Thanks.***




Prepared By: W.D Priyantha Menaka

School: WP/ Minu/ Dudley Senanayake A.M.V

Mirigama.